# ගොවි සංවිධාන අවශ්‍ය ඇයි?

**හැඳින්වීම**

ගොවිතැන, ලාංකිකයන්ගේ ප්‍රධාන ජීවනෝපාය වූයේ ශිෂ්ටාචාරයේ ආරම්භයත් සමඟය. ඉතිහාස මූලාශ්‍රවලින්, ගංගා ආශ්‍රිත ගොවිතැන පසුකාලීනව වැව් ආශ්‍රිත දියුනු ගොවිතැනක් බවට පත්වූ හැටි පෙන්වා දෙයි. සියවස් පහක පමණ බටහිර විදේශිකයන්ගේ පාලන කාලය තුළ එම ගොවිතැන මූල් කොටගත් ආර්ථිකයට පිරිහී ගිය අතර පාරම්පරික ගැමි ජීවිතය නගර හා වතු මූල් කොටගත් ආර්ථිකයට පරාදීන කරනු ලැබීය. නගර හා වතු රටේ පාලනයේ හා ආදායම් උපැයීමේ මධ්‍යස්ථාන වුවද බහුතර ජනතාව ඔවුන්ගේ ජීවනෝපාය වූයේ ගොවිතැනයි. රටේ ජනගහනයෙන් සියයට 70 ක පිරිස තවමත් ගැමියන් හෝ ගොවියන් ලෙස ජීවත්වන පිරිසකි. මෙම ලිපියෙන් පෙන්වා දීමට උත්සාහ ගෙන ඇත්තේ රටේ බහුතර ජන කොටසක් වූ ගොවි ජනතාව ඔවුන් සතු දැනුම, ශක්තිය හා අයිතිය ඔවුන්ගේ ස්වාධීන පැවැත්මටත් රටේ සංවර්ධනයටත් ප්‍රයෝජනවත් ලෙස සංවිධානය කරගත යුත්තේ මන්ද? ගොවි ජනතාව සංවිධානය නොවූ පිරිසක් ලෙස ජීවත්වන්නේ මක්නිසාද ? යන කරුණු සොයා බැලීමටයි.

**සංවිධානය විය යුත්තේ ඇයි?**

ඉහතින් දැක්වූ පරිදි ජනගහනයෙන් බහුතරය තවමත් ජනපද හා ගම්වල ජීවත්වන ගොවිතැන ජීවනෝපාය කරගත් පිරිසකි. රටේ ආහාර නිෂ්පාදනය සඳහා ,වුන්ගේ සම්මාදම සැලකිය යුතු මට්ටමක පවතී. එහෙත් ඔවුන්ගේ නිෂ්පාදනයට හා ජීවිතයට බලපාන කිසියම් ගැටළුවක් ඔවුනට සාමූහිකව ඉදිරිපත් වීමේ හෝ බලපෑම් කිරීමේ හැකියාව ඉතා සීමිතය. එයට එක් හේතුවකි ගොවියා හෝ ගැමියා එක් පොදු සංවිධානාත්මක රාමුවක් තුළ එකතු වී නොසිටීම.

ගොවි ජනතාව හැරුනු විට වතු කම්කරුවන්, නාගරික කර්මාන්ත ශාලා හා රජයේ කම්කරුවන් දේශපාලනමය හෝ වෘත්තිමය වශයෙන් සංවිධානය වී සිටිති. ඔවුන්ගේ වෘත්තියට අදාල ප්‍රශ්නවල දී සාමූහිකව විසඳුම් සෙවීමට මෙන්ම අවශ්‍ය බලපෑම් කිරීමටද හැකියාව ඔවුන් සතුව ඇත. එහෙත් ගොවියන් අතර එසේ වෘත්තිමය වශයෙන් ගොඩනැංවුනු පොදු ගොවි බලයක් හෝ සංවිධානයක් තවමත් වර්ධනය වී නොමැත.

ලෝකයේ වෙනත් කෘෂිකාර්මික රටවල ගොවීන් අතර ප්‍රබල සංවිධාන ක්‍රම දැකිය හැකිය. ගොවි සංගම්, වෘත්තිය ගොවි සමිති, දේශපාලන ගොවි සම්මේලන හෝ ගොවි නායකයන් යටතේ මෙහෙයවන ප්‍රජා සංවිධාන ආදී වශයෙන් ,එවැනි සංවිධාන මගින් ගොවීන්ගේ අයිතිවාසිකම් සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ඒවා පෙලඹී තිබේ. වෘත්තිමය ප්‍රශ්නවලදී නීතිඥයින් යොදවා සංවිධාන මගින් උසාවිවලට කරුණු ඉදිරිපත් කල අවස්ථාද ඇත.

**පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරි**

**එම්. ජී. එම්. රෂාක් විසිනි.**

එපමණක් නොව ගොවීන් කිසියම් පදනමක් යටතේ සංවිධානය වීම තුළින් ඔවුන් දැනට පෞද්ගලිකව ලබන ආර්ථික වාසි වලට වඩා වැඩි ලාභයක් ලබාගත හැකිය. ගම් මට්ටමේ හෝ ප්‍රාදේශීය මට්ටමේ ඇති, ගොවිතැනට බලපාන සම්පත් ගොවි සංවිධාන මගින් හොඳින් නඩත්තු කළ හැකිය. තායිවානය වැනි සමහර රටවල කුඹුරුවලට ජලය සපයන ඇලවේලි, නිර්මිත අලුත්වැඩියාවන් කෙරෙනුයේ, ගොවි සංවිධාන මගින්, ඉංජිනේරු

වත්, කාර්මිකයන්ට වැටුප් ගෙවා සේවය ලබා ගැනීමෙනි. ගොවියාට අයිති සම්පත් පාලනය කිරීමට ගොවියාට අයිතියක් තිබෙන බව ඉන් පැහැදිලි වේ. එහෙත් ඒ අයිතිය ලබාගත යුත්තේ හොඳින් සංවිධානය වීම තුළින් බවත් ඒ සඳහා නායකත්වයක් හා මෙහෙයවීමේ හැකියාවක් ගොවියාට ඇති බව ඒ සම්බන්ධ අධ්‍යයනය කළ පර්යේෂකයෝ පෙන්වා දෙති.

ප්‍රායෝගිකව බලන විට ගොවියන් මුහුණ දෙන ප්‍රශ්න ඒකාකාරී නොවේ. එහෙත් හැම ගොවියෙක්ම එවැනි ප්‍රශ්න එකකින් හෝ වැඩි ගණනකින් පීඩා විඳින බව සත්‍යය.

★ ජලය හිඟකම හෝ ජලය තිබුණත් ඒවා නිසි පරිදි බෙදාගත නොහැකිකම.

★ බීජ, පොහොර, රසායනික ද්‍රව්‍ය වැනි යෙදවුම් ලබා ගැනීමට ඇති අපහසුතා හෝ මිල අධික බව.

★ නිපදවන භෝග වලට ප්‍රමාණවත් මිලක් නොලැබීම, අතරමැදි වෙළෙන්දන්ගේ සූරාකෑම වැනි අලෙවිය පිළිබඳ ප්‍රශ්න

වෙනත් ආදායම් නොමැතිකම හෝ ණය බරින් මිරිකීම.

★ වගා පාළුවීම, ඉඩම් නැතිකම වැනි පොදු ප්‍රශ්න.

මෙවැනි ප්‍රශ්නවලට විසඳුම් මෙතෙක් බොහෝ විට ගෙන ඇත්තේ ඉහළ මට්ටමෙන් පමණි. එනම් රජයෙන් හෝ වෙනත් ආධාර සංවිධාන මගින් මෙවැනි ප්‍රශ්න වලට විසඳුම් සඳහා නොයෙකුත් වැඩ සටහන් ක්‍රියාත්මක කරමය. නමුත් ගොවීන් විසින් විසඳා ගත හැකි මට්ටමේ ප්‍රශ්න විසඳා ගැනීමට බොහෝ විට ඵලදායි සැලසුම් දරා නැත. උදා. වශයෙන් ගොවිතැනට අවශ්‍ය මිල අධික යන්ත්‍ර, උපකරණ (අත් ට්‍රැක්ටර්, කොළමඩින යන්ත්‍ර) ගොවියන් විසින් පිහිටුවා ගත් සංවිධානයක් මගින් මිලදී ගෙන එහි සාමාජිකයන් අතර බෙදාහැරිය හැකිය. අවශ්‍ය නම් සුලු ගාස්තුවක් අයකර එය සංවිධානයේ අරමුදලට යොදවාගත හැකිය. එකම ඇලකින් කුඹුරු කට්ටි කිහිපයක් වගාකරන ගොවීන්ට ඔවුන්ගේ කුඹුරුවලට උවමනා වතුර කලට වේලාවට ලබා ගැනීමට, ආරාවුල් අඩුකර ගැනීමට එකතු වී වැඩකළ හැකිය. මෙයින් අදහස් කළේ ගොවියන් මුහුණ දෙන ගැටළු ඉහළින් ලැබෙන ආධාර යහ උපකාර මගින් පමණක්ම විසඳාගත නොහැකි බවත් ඒ සඳහා ගොවීන්ටද කළ හැකි වැඩ කොටසක් මෙන්ම හැකියාවක් ද ඔවුනට තිබෙන බව පෙන්වා දීමටයි.

නිදහසින් පසු ලංකාවේ බලයට පත් හැම රජයක්ම වැඩි මුදල් ප්‍රමාණයක් වැයකර ඇත්තේ කෘෂිකාර්මික, වාරි කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අංශවලටයි. එසේම ජාත්‍යන්තර හා දේශීය සංවිධාන වලින් ද ආධාර ගලාගියේ ඉහත කී අංශවලට නමුත් මෙතෙක් ලැබූ අත්දැකීම් හා පර්යේෂණවලින් පෙනී යන්නේ එම ආධාර, සම්පත් නියම ඉලක්කය කරා එනම් ගොවි ජනතාව කරා ළඟාවී ඇත්තේ ඉතාමත් අඩුවෙන් නැතහොත් අසම්පූර්ණව බවයි. මෙයට හේතූන් රාශියක් තිබිය හැකිය. එහෙත් එක් වැදගත් හේතුවක් වන්නේ ගොවීන් සතුව ඇති අඩු දැනුම එවැනි ආධාර ලබා ගැනීමට ශක්තිමත් සංවිධාන ක්‍රමයක් ගම් මට්ටමේ නැතිකම බව අධ්‍යයන වලින් පෙන්වා දී ඇත. යනාදියයි. මේ නිසා ගම් මට්ටමේ වැඩ සටහන් ක්‍රියාත්මක කරන ආයතන දෙපාර්තමේන්තු වලට ඒ සඳහා අතිරේක මුදලක් වැය කිරීමට සිදුවී තිබේ. එසේ එක් එක් අවශ්‍යතා සඳහා ග්‍රාමීය මට්ටමේ සංවිධාන ඇරඹුනත් වැඩ සටහන් අවසාන වෙනවාත් සමගම ඒවාද නැතිවී යයි. ඒ නිසා ගමට එන ආධාර සම්පත් හා බාහිර දැනුම උරාගැනීමටත්, ඒවා හොඳින් ගොවි ජනතාව අතර බෙදාහරින්නටත් ගම්මට්ටමේ ගොවියන්ගේ හෝ ගැමියන්ගේ සංවිධාන රටාවක් තිබීම අපතේ යන සම්පත් ගොවියාට ලබාගැනීමට වඩාත් පහසුය.

ගොවි ජනතාව සංවිධානය වීම ගොවීන්ට පමණක් නොව රජයටද පිටුවහලකි. ගොවීන් අතර හොඳ සංවිධාන ක්‍රමයක් පවතින විට රජයට ද හැකියාව තියෙනවා. කිසියම් ප්‍රතිපත්තියක් පනතක් පහසුවෙන් ක්‍රියාත්මක කිරීමට රජය මගින් අළුතෙන් ක්‍රියාත්මක කිරීමට අදහස් කරන මෙහෙයුම් හා නඩත්තු ගාස්තු ලබාගැනීමටම නම් ගොවියන්ට එහි ප්‍රතිලාභ පෙන්වා දිය යුතුයි. එම ගාස්තු ලබා ගැනීමට "ගොවි සංවිධාන" තුළින් කිරීම වඩා පහසුය. ගොවීන්ට විශ්වාසයක් ගොඩනැගෙන්නේ එම ගාස්තු ඔවුන් සඳහාම වැය කරන බව ඔවුනට පෙනී ගියහොත් පමණි. රජය මගින් දැනට මේ පිළිබඳව පියවරක් ගනිමින් ගොවි සංවිධාන ඇති කිරීමට තීරණය කර ඇත්තේ ඒ නිසාය. ලංකාවේ මෙයට පෙර මෙසේ ගොවීන්ගේ, ගැමියන්ගේ යහපත සඳහා ඉදිරිපත් වූ රාජ්‍ය වැඩ පිළිවෙලවල් අසාර්ථක වූයේ ඒවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ග්‍රාමීය සංවිධාන පරිසරයක් නොතිබීම බව සමහරුන්ගේ අදහසයි. කුඹුරු ඉඩම් පනත පිළිබඳ විවාදයක දී එවකට මන්ත්‍රීවරයෙකු වූ පීටර් කෙනමන් මහතා පාර්ලිමේන්තුවේදී වරක් මෙසේ පැවසීය.

කුඹුරු ඉඩම් පනත නීතිමය වශයෙන් ගත් විට ඉතාමත් යහපත් පියවරක් නමුත් ප්‍රායෝගිකව බලන විට එය හොඳින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය රාජ්‍ය මට්ටමේ. දේශපාලන මට්ටමේ හෝ ග්‍රාමීය මට්ටමේ ශක්තිමත් සංවිධාන 'ක්‍රමයක් දක්නට නැත."

වර්තමානයේ ලංකාවේ දේශපාලන පක්ෂ වලට සම්බන්ධවූ ගොවි සංවිධාන කිහිපයක් ක්‍රියාත්මක වෙමින් පවතී. නමුත් මෙවැනි ගොවි සංවිධානවලට සිදුවී ඇත්තේ කම්කරු වෘත්තිය සමිති මෙන්ම ඒ ඒ දේශපාලන සංකල්ප වලට අනුකූල වන පරිදි ගොවි ප්‍රශ්න විග්‍රහ කිරීමටත් උවමනාවට වඩා දේශපාලනීකරනය වීමක් බව කිව යුතුය. එවැනි ගොවි සංවිධාන වල පොදු ගොවි හඬක් හෝ බලපෑම් කිරීමේ ශක්තියක් නැත. අවශ්‍යව පවතින්නේ පොදු ගොවි ජනතා ප්‍රශ්න වලට ගොවියන් විශයෙන් ඉදිරිපත් වන සංවිධාන රටාවකි. පවතින දේශපාලන මතවාදයන් හෝ දර්ශනයන් ගොවියාගේ මූලික අවශ්‍යතා වලින් පරිබාහිර වුවත් ගොවියා ඔහුගේ කුඹුරු හෝ ගොවිතැනට අදාල ප්‍රශ්න වලින් පරිබාහිර අයෙක් නොවේ. ගොවි සංවිධාන අවශ්‍ය වන්නේ පසුව කී පදනමේ සිට ගොඩනගන ලද ඒවා මිස දේශපාලන න්‍යායන් වලට අදාල සංවිධාන ව්‍යුහයක් නොවේ.

ගොවි ජනතාවගේ ආර්ථික දියුණුව හා සමාජ සුභ සාධනය සඳහා ඉදිරි අනාගතය තුල නොයෙකුත් වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට සැකසුම් හා ප්‍රතිපත්ති සකස් වෙමින් පවතී. උදාහරන වශයෙන්


★ ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ වැඩ පිළිවෙල

★ ජලපාලන හා ජලසම්පාදන වැඩ සටහන්

★ අතුරු භෝග වගා ව්‍යාපෘති

★ කෘෂිකර්මාන්තය මූල් කොටගත් කර්මාන්ත සංවර්ධන වැඩ සටහන් දැක්විය හැක.

මෙවැනි වැඩ සටහන හැම එකකම ඉලක්කය ගොවියාය. එම නිසා එම සම්



පත් හා වැඩ සටහන් වලින් නිසි ප්‍රයෝජන ලබා ගැනීමට ගොවියාට අයිතියක් නැත. මෙතක් ගම්වල හා ජනපදවල සිදු වූයේ එවැනි වැඩ සටහන් වලින පරසක් පමණක් සහන ලබා ගැනීමයි. එයට හේතුව ගොවීන් අතර අන්‍යෝන්‍ය විශ්වාසයක, එකඟ බවක් හෝ සංවිධානාත්මක බවක් නොතිබීමයි. එම නිසා ගොවීන් වශයෙන් සංවිධානය වීමෙන් අතීතයේ නොලැබී ගිය සම්පත් අනාගතයේදීවත් ලබා ගැනීමට කිසියම් පදනමක් යටතේ එකතු වීම වැදගත් හා ප්‍රයෝජනවත් බව පෙනී යයි. බාහිරන් එන සම්පත් ආධාර, දැනුම ලබා ගැනීමට ඒවා නිසි පරිදි, නියමිත ගොවියාට අත් කර දීමට පුද්ගලයෙකුට, දෙපාර්තමේන්තුවකට වඩා සංවිධානයකට පහසුය.

**ගොවීන් සංවිධානය නොවන්නේ ඇයි?**

ගොවියන් අතර ප්‍රබල සංවිධාන ක්‍රමයක් බිහි නොවන්නේ හෝ බිහි නොවූයේ මන්ද යන්න පිළිතුරු සැපයීම තරමක අපහසු කාර්යයකි. කෙසේ වුවද මෙහිලා ප්‍රධාන කරුණු කිහිපයක් පමණක් සලකා බැලීම සුදුසුය.

ගොවීන් වශයෙන් සැලකෙන ගැමියන් ජනපද වාසීන් හෝ සුළු ගොවීන්, නාගරික කම්කරුවන් මෙන් සංවිධානය කිරීම තරමක් අපහසු කාර්යයක්. විශේෂයෙන් බහුතර ගොවි ජනතාව (නොදියුණු) ග්‍රාමීය පරිසරයන් හා වාරිපද්ධති ආශ්‍රිතව ජීවත්වන පිරිසක් ජනාවාස ව්‍යාප්තිය මෙන්ම ගම් අතර සම්බන්ධතාවයද සමීප වූවක් නොවේ. ඒ නිසා ගොවීන් අතර අන්‍යෝන්‍ය සන්නිවේදන හෝ තොරතුරු හුවමාරු වීමක් ඇතිවීම සීමාවී ඇත - එමගින් ඔවුන්ගේ පොදු බව ප්‍රාදේශීය වශයෙන් වෙන්වී ඇත

ගොවීන්ගේ ආජීවිකාය පදනම් වී ඇත්තේ තමන්ගේ හෝ තමන්ට සැපයන ඉඩමක භෝග වගා කිරීම මත ඔවුන්ගේ පෞද්ගලිකත්වය අනෙක් වෘත්තීන් කරන අයට වඩා වැඩිය. එසේම ඔවුන් සතුව ස්ථාවර මුදල් ඒකරාශි වීමක් නැත. සංවිධානය වීමට අවශ්‍ය ආර්ථිකමය දායකත්වයක් ලබා දීම ගොවියාට අපහසුය. එසේම ගොවියා දවසේ නියමිත පැය ගණනක් පමණක් සිය රැකියාව කරන පුද්ගලයෙක් නොවේ දේශගුණය අනුව ඔහුගේ වැඩ කටයුතු වෙනස් වේ. කම්කරුවකුට හෝ වැටුප් ලබන සේවකයකුට මෙන් නිවාඩු දිනයක් ගොවියාට නැත. ඒ නිසා සංවිධානය වීම රැස්වීම් පැවැත්වීම ගොවියාට සරමක පහසු කාර්යයකි.

ලංකාවේ ගැමි සමාජය. තරමක් ගැඹුරින් සොයා බලන විට ගොවිතැන වෘත්තියක් ලෙස කරන පිරිස් අතර විවිධ කොටස් දක්නට ඇති බව පෙනී යයි. ඉඩම් හිමියා හා ඉඩම වගා කරන්නා අතර එකිනෙකට වෙනස් වෘත්තිමය සම්බන්ධකම් දැකිය හැක. ඉඩම් අයිතියක් තිබුනත් ඒවා වෙනත් අයට ගොවිතැන් කරන්නට දී ආදායමෙන් කොටසක් ලබා ගන්නා ඉඩම් හිමි ප්‍රභූ කොටස පළමු පිරිසයි. දෙවන ගනයේ පිරිස තමන්ගේ ඉඩමෙහි කොටසක් තමන් විසින් වගා කරන අතරම කොටසක් අඳේට හෝ බද්දට වගා කිරීම සඳහා දී ඇති අයයි. මොවුන් බොහෝ විට ඉඩම් හිමි ගොවියන් වශයෙන් පොදුවේ හැඳින්වේ. තුන් වන පිරිස තමන්ට හිමි ඉඩම් කෙටස තමන් විසින්ම වගා කරමින් යැපුම් මට්ටමේ ජීවිතයක් ගතකරන ගොවියන්, ගොවි සමාජයේ පහළ ස්ථරය වශයෙන් සලකන්නේ ඉඩම් හිමිකමක් නැති අනෙක් අයගේ ඉඩමක අඳයට හෝ බද්දට ගොවිතැන් කරන අඳ ගොවියන් හා අර්ධකාලීන වශයෙන් වැඩකරන ගොවි කම්කරුවන් ලෙස ගැනෙන කොටසයි.

ලංකාවේ ගම්වල ගොවීන්ගේ සංයුතිය ඉහත කී ආකාරයට සමන්විතව ඇත. ඉහතකී කොටස් වලට අමතරව වෘත්තියක් වශයෙන් ගොවිතැන කරන අනෙක් විශාල පිරිස වාරි පද්ධතිය ආශ්‍රිතව රජයෙන් ලබා දුන් ඉඩම්වල ගොවිතැන් කරන ජනපද ගොවීන් මේ අය ඉහතකී පිරිස් වලට වඩා වෙනස් සමාජ හා ආර්ථික සම්බන්ධකම් ඇති පිරිසකි. මේ අයුරින් බලන විට මේවැනි එකිනෙකට වෙනස් ගොවි ජනතාවක් සංවිධානය කිරීම ප්‍රායෝගික වශයෙන් තොමත් අපහසු කාර්යයක් ඉහත කී එකිනෙක ගොවියන් තුළ ඇති අවශ්‍යතා, බලාපොරොත්තු වෙනස්ය. උදා වශයෙන් ගත හොත් දුප්පත් ගොවියෙක් ඔහුගේ පැවැත්ම සඳහා ඉඩම් හිමි ගොවියකු මත රැඳී සිටියය හැකිය. එවැනි පරාදීන තත්වයක් තුළ දුප්පත් ගොවියා සංවිධානය වී නැගී සිටීමට උනන්දු වන්නේ ඔහු

යේ එම පරාධීනතාවය බිඳීමට සංවිධානය වීමෙන් යම් කිසි පිට වහලක් ලැබෙනවා නම් පමණි. පාරම්පරික ගම් තුළ අද ගොවියා හා ඉඩම් හිමියා අතර පවතින්නේ සමීප සම්බන්ධතාවයක්. මෙම සම්බන්ධතාවය ආර්ථික වෘත්තීමය සමාජමය වශයෙන් පමණක් නොව සංස්කෘතික වශයෙන්ද තවදුරටත් දැඩි කර ඇත. මේ නිසා නාගරික හෝ වතු සමාජයේ මෙන් පැහැදිලි පංතිමය හා වෘත්තීමය වෙනසක් ලංකාවේ ගොවි සමාජය තුළ දක්නට නැත. ඒ නිසා පාරම්පරික ගම්වල ගොවියන් ගේ පොදු හැඟීමක්, සංවිධානය වීමේ පොදු අරමුණක් ඇති කිරීම තරමක අපහසු කාර්යයකි.

මේ හැරුනුවිට ගොවියන් තුළ සංවිධානය වීමේ අවශ්‍යතාවයක් ඇති නොවීමට රජයෙන් ක්‍රියාත්මක කළ වැඩ පිළිවෙලවල් ද හේතු විය. නිදහසින් පසු ලංකාවේ බලයට පත් වූ රජයන් හැමවිටම සුභසාධනය මුල් කොට ගත් ප්‍රතිපත්ති අනුගමනය කළේය. නිදහස් අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා ආහාර, වැනි දේවල් නිසා ගැමියන් තුළ පැනනැගිය හැකි පීඩනයන් සමනය කිරීමට පියවර ගනු ලැබීය. දේශපාලනඥයන්ද ගමට ගියේ සහනාධාර ලබාදෙන බව පොරොන්දු වෙමිනි. මේ නිසා හැම විටම බාහිර සම්පත්, ආධාර උපකාර ලැබෙන පරාධීන කොටසක් බවට ගැමියන් පත්වූහ. රැකියා වියුක්තිය, තරුණ අසහනය ගැමියන් තුළ වැඩිවිය නගරය කර ඇදී යන ශ්‍රම බලයක් දකින්නට ලැබුනි. ගැමි සංවිධානාත්මක ශක්තියක් ගොඩනැගීමට අවශ්‍ය පරිසරයක් ඒ තුළ දක්නට නොවීය.

ගොවියන්, හෝ ගැමියන් ලෙස හැඳෙන ගොවිතැන ජීවනෝපාය කොට ගත් ගම්බද ප්‍රදේශවල අනුගමනය කළ සමහර සංවර්ධනමය වැඩ සටහන් වල තිබුනු අඩුපාඩු හා දූෂණ නිසාද ගම් මට්ටමේ හොඳ සංවිධාන රටාවක් බිහිවීම වළක්වනු ලැබීය.

ගම් මට්ටමේ සංවර්ධන වැඩ සටහන් අසාර්ථක වීමට එක් හේතුවක් වූයේ එම වැඩ සටහන් ගැමියන් අදහස් කළේ රජයෙන් ලබාදෙන ආධාර, එසේ නැත්නම් ඒවා රජයේ නිලධාරීන්ට අයිති රාජකාරියක් ලෙසයි. මේ නිසා ජනතාව ඒවා දෙස බැලුයේ "අපේ" කියන හැඟීමකින් තොරවය. "රජය" හා "ජනතාව" අතර පරතරය නිලධාරීන් ගේ අක්‍රියකාරකම් හා දූෂණ නිසා වෙදූරටත් ඈත් විය. බිහිවූ සංවිධාන සැබෑ ජනතා සංවිධාන වයේ නැත. නායකත්වය ගත්තේ බලපුලුවන්කාර පිරිස්ය. මේ නිසා ගැමියන් අතර සංවිධානය කෙරෙහි විශ්වාසයක් ගොඩ නැගුනේ නැත.

ගැමි සංවිධාන ගොඩ නැගීමට බාධාවක් වූ තවත් කරුනක් වූයේ සාම්ප්‍රදායික කුලවාදයයි. ගොවිතැන කිසියම් කුලයක වෘත්තියක් ලෙස සම්ප්‍රදායික ආකල්ප හා ඇගයුම් ඇති වැඩිහිටියන් දැරූ අදහසකි. ලංකාවේ කුල ක්‍රමය තුළින් ගොවිතැන කරන්නන් අතර මෙන්ම ඉන් බාහිර පුද්ගලයන් අතරද බෙදීම් දක්නට ලැබුනි.

ප්‍රබල ග්‍රාමීය ගොවි සංවිධාන රටාවක් බිහි වීමට ග්‍රාමීය දේශපාලන ව්‍යුහයද බාධා පැවේය. ගම් මට්ටමේ දේශපාලන වැඩ වල නියැලුනේ නගරයේ පාසල් වලින් අධ්‍යාපනය ලැබූ එසේ නැත්නම් ගමේ ඉඩම් වැඩි හරියක් අයත්ව තිබූ ගමේ "වැදගත්" යැයි සැලකූ පිරිස්ය. මේ අය කටයුතු කලේ නිතරම ඉහල සිටින දේශපාලන බලවතුන්ගේ විධි විධාන අනුව මිස ගමේ ගැමියන්ගේ බලපෑමට යටත්ව නොවේ. ගැමියන් ඡන්දය දුන්නේ තමන්ගේ ඉඩම් අයිතිකරු සතුටු කරන්නට හෝ එසේ නැත්නම් තම දූ පුතුන්ට රැකියා ලබා ගැනීමට මිස තම පරාධීන භාවයට විරුද්ධව නොවේ. ඒ නිසා ගම් මට්ටමේ දේශපාලනය තුළින් ගැමියන් කුඩා කොටස් වශයෙන් බෙදී සිටියා මිස තමන් ගේ පොදු ප්‍රශ්න වලට සහයෝගයෙන් මුහුණ දුන්නේ නැත.

**4. සමාලෝචනය -**

රටේ ආර්ථිකයේ වැදගත් කාර්යභාරයක් ගොවි ජනතාව ඉටු කලද ඔවුන්ගේ සංයුතිය හා ඔවුන් මුහුණ දෙන ප්‍රශ්න වල සංකීර්ණ භාවයක් දක්නට තිබෙන බව ඉහතින් පැහැදිලි විය.

ගොවියන් සංවිධානය වීම, ඔවුන්ගේ පමණක් නොව ඔවුනට සම්බන්ධ සෑම අංශයකටම රුකුලක්. එහෙත් මෙතෙක් ලබා ඇති අත්දැකීම්, ගොවියන් අතර ඇති ආකල්ප, ඇගැයුම් හා ජීවන රටාව සංවිධානය වීමට ඇති ඉඩකඩ අහුරා තිබේ. කෙසේ වුවද වර්තමානයේ ග්‍රාමීය ගොවිතැනට වඩා වාරිපද්ධති ආශ්‍රිත ගොවිතැන නව වාරිකර්මාන්ත ව්‍යාපාරයන් සමග දියුණු වෙමින් පවතින බව පෙනේ. ජනපදිකයන් ලෙස හඳුන්වන මෙම ගොවියන් අතර පවතින, ආර්ථික සමාජීය හා වරප්‍රසාදමය අසමානතාවයන් ගැටියාම සාපේක්ෂව අඩුය. මෙවැනි ජනපදිකයන් මුහණදෙන ප්‍රශ්න වල පොදු බවක් දක්නට තිබේ.

මේ නිසා රටේ අනෙකුත් ගොවිජන කොටස්වලට වඩා සංවිධානය වීමේ හැකියාව ජනපදික ගොවියන් අතර පවතී. පොදුවේ සලකා බලන විට ඉදිරි අනාගතයේ දී ගොවි ජනතාවගෙන් වැඩි පිරිසක් වාරි පද්ධති ආශ්‍රිත දෙන ලද හැම් ප්‍රදේශයක් තුළ ගොවිතැන් කරන ජනපදිකයන් වන බව පැහැදිලිය. මේ නයින් බලන කල මෙතෙක් අසංවිධිතව පැවති ගොවි ජනතාවක් අනාගතයේ සංවිධානාත්මකව නැගී සිටීමේ ඉඩකඩ පවතින බව පෙනේ.

අනෙක් අතින් වර්තමනයේ වාරි පද්ධති ආශ්‍රිත ගොවි සංවිධාන පිහිටුවීමේ අවශ්‍යතාවය හා එහි ප්‍රයෝජනවත් බව රජය විසින් ද වටහා ගෙන තිබේ. ඒකාබද්ධ මහා වාරිමාර්ග පද්ධති කළමණාකරන ව්‍යාපෘතිය (ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය). යටතේ ගොවි සංවිධාන පිහිටුවීමට මෙතෙක් ලාංකික ග්‍රාමීය සංවිධාන පිහිටුවීමේ යොදාගත් උපාය මාර්ගවලින් බැහැර වූ නව උපාය මාර්ගයන් අනුගමනය කිරීමට පියවර ගෙන ඇත.

කෙසේ හෝ වේවා යම්කිසි සංවිධානයක පැවැත්ම තීරණය වන්නේ කිසිවෙක් විසින් බිහිකරනු ලබනවාද එසේ නැත්නම් එහි ගොවි ජනතාවගේ අවශ්‍යතාවය හා අවබෝධය තුළින් බිහිවූවක්ද යන්න මතයි. ඕනෑම සංවිධානයක බිහිවීමට අරමුණු, පොදුවේ බලපාන ප්‍රශ්න තිබිය යුතුවා මෙන්ම ඒවා මගහරවා ගැනීමේ අවශ්‍යතාවය හා හැකියාව ද එම සංවිධානයට පැවතිය යුතු වේ. එම නිසා තමන් අවට පරිසරය පිළිබඳව අවදිව සිටින, තමන්ගේ පැවැත්මට බලපාන සම්පත් නිසි ලෙස පාලනය කරගත හැකි ශක්තිමත් සංවිධාන රටාවක් අනාගත ගොවි ජනතාව තුළින් බිහිවීම කාලෝචිත හා අත්‍යවශ්‍ය බව මෙහිලා අවසන් වශයෙන් සඳහන් කළ යුතුය.



ගොවීන් සංවිධානය වී පොදු සේවාවක නියලුන අවස්ථාවක්.